## බළන්ගොඩ නගර සභාව
## 2022-10-31 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.10.31**

**වේලාව - පෙ.ව. 9.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්. රුමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රිනී | තරංගනී සමරසේකර මැතිතුමිය |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී.පේමදාස මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රිනී | එම්.ජී. ශාන්තිලේඛා මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | ඩී.එම්.ජේ.යූ ධර්මරත්න මයා |

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ගරු සභාවේ වැඩකටයුතු ආරම්භ කරන ලදි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රීවරියන් වන සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය හා තරංගනී සමරසේකර මැතිතුමිය විසින් අළුතින් ඉදිවන පදික කඩයේ මිල සම්බන්ධයෙන් ගෙන ඇති තීරණය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා විශේෂ මහ සභාවක් කැඳවන ලෙස කරන ලද ඉල්ලීම අනුව මෙදින විශේෂ මහ සභාව පවත්වන බව පවසන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මේ සඳහා විශේෂ සභාවක් නොදී සිටීමට තමන්ට හැකිව තිබූ නමුත් යම් යම් වැරදි මතයන් පසුගිය දිනවල ඇති වී තිබූ නිසා වඩාත් විනිවිදභාවයෙන් කටයුතු කළ නිසා මෙම කාරණය සාකච්ඡා කිරීමට අවස්ථාව සලසා දුන් බව ද ගරු නාගරික මන්ත්‍රී චමික විමලසේන මැතිතුමා සභාපතිව සිටි කාලයේ දී පදික කඩ 32 ක් ඉදි කර ලබා දුන් අතර, එය ලබා දුන් අය සම්බන්ධයෙන්වත් සොයා නොබලා එම යෝජනාවට එකඟ වූ නමුත් සාධාරණ හේතු මත ලබා දුන් එක් කඩයක් සම්බන්ධයෙන් මෙම ගැටලුව ඇති කර ගෙන ඇති බව ද ගරු ආණ්ඩුකාරතුමාගෙන් පරීක්ෂණයක් තමන් ඉල්ලා සිටින අතර, එසේ වුවහොත් අනිකුත් සියලුම කඩවලට එය බලපෑ හැකි බව ද පවසන ලදී. එමෙන්ම පදික කඩවල ඉඩ කඩ ප්‍රමාණවත් නොවන නිසා කඩ ඉදිරියෙන් වහලවල් සවි කර ගෙන ඇති බව ද එම නිසා මෙම පදික කඩය ඉදි කිරීමේ දී අඟල් 11 ක් වැඩිවන පරිදි ඉදි කර ඇති බව ද මේ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා අවස්ථාව සලසා දෙන බව ද වැඩිදුරටත් පැවසීය.

**ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා පෙ.ව.9.05 ට සභාවට පැමිණෙන ලදී.**
**ගරු නාගරික මන්ත්‍රීනී එම්.ශාන්තිලේඛා මැතිතුමිය පෙ.ව 09.08ට සභාවට පැමිණෙන ලදී**

**1. අලුතින් ඉදි වන පදික කඩයේ මිල සම්බන්ධයෙන් ගෙන ඇති තීරණය පිළිබඳ සාකච්ඡා කිරීම**

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා**
ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් කාලයක් තිස්සේ පදික වෙළඳාමෙහි නිරත වූ අසරණ අයෙක් බැවින් සුබ්‍රමනියම් චන්ද්‍රිකා යන අය වෙත පදික කඩයක් ලබා දීම සඳහා තමන් කැමැති වූ නමුත් කඩය වෙනත් අයකු විසින් ඉදි කරන ලද බව හා චන්ද්‍රිකා යන අය වෙත ලබා දෙන පවසා වෙනත් අයෙකුට ලබා දී ඇති බවට විවිධ කතා පැතිර යන බව ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**
ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් හේතු කාරණා කිහිපයක් පදනම් කරගෙන විශේෂ සභාවක් ඉල්ලූ බව ද සභා තීරණය ගෙන සති දෙකක් ඇතුලත කඩ කාමරය ඉදි වුණු බව ද පවසන ලදී.

එමෙන්ම තමන්ට ගැටලු කිහිපයක් පවතින අතර, සභාවේ වැඩ අධිකාරී හා කාර්මික නිළධාරී විසින් මෙහි සැලැස්ම සකස් කරන ලද්දේද? පදික කඩ ලබා දීමේ දී එහි කඩයක් නොලැබීමට තරම් හේතු වූ අසාධාරණය කුමක්ද? එම කාලයේ දී ඒ පිළිබඳව ලිඛිතව දැනුම් දෙමින් අභියාචනාවක් ඉදිරිපත් කර තිබුණේද? යන ප්‍රශ්න සම්බන්ධයෙන් පිළිතුරු බලාපොරොත්තු වන බව පැවසීය.

එමෙන්ම ජනතාව විසින් පත් කර එවූ ජනතා නියෝජිතයන් වශයෙන් ජනතාවට යහපතක් කළ යුතු බව ද අසරණ අයකු දියුණු වීමට උත්සාහ කරන්නේ නම් උපකාර කළ යුතු අතර, හෘද සාක්ෂියට අනුව සිදු කරන්නේ නම් එලොවට මෙන්ම මෙලොවට ද යහපත් බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් පැවසූයේ මෙම අයගෙන් ලැබුණු ඉල්ලීම් ලිපිය සභාවට ඉදිරිපත් කර සභා තීරණයකින් පසුව ලබා දී ඇති බවයි.

**පෙ.ව 9:14 ට ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**පෙ.ව 9:14 ට ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් තමන් පදික වෙළඳාමේ සිට පැමිණි අයෙක් බව ද පදික කඩ පෙළ ඉදි කිරීමේ දී ඒ සඳහා තමන් විරුද්ධ වූ බව ද එම ස්ථානය නාගරික සංවර්ධන අධිකාරියේ සැලැස්මට අනුව කඩ ඉදි කළ නොහැකි බව ද පදික කඩ ලබා දීමේ දී පදික වෙළඳාමේ සිටි අයට නොව වෙනත් අයටත් ලැබී ඇති අතර, එම නිසා මෙම අය ඉල්ලීමක් කර ඇති බව ද කඩ නොලැබීම සම්බන්ධව පසුගිය අවුරුදු කිහිපයේ දී ඉල්ලීමක් කර නැත්තේ සභාව ගැන විශ්වාසයක් නොමැති නිසා විය හැකි බව ද ඔවුනට සිදු වූ අසාධාරණය පිළිබඳව සභාවේ සාකච්ඡා කර තීරණයක් ගත් බැවින් නැවත සාකච්ඡා කිරීම අනවශ්‍ය බවද තක්සේරුවක් මත සාධාරණ ලෙස ලබා දී ඇති බව ද විශේෂ සභාවක් කැඳවමින් තවදුරටත් මෙම කරුණු සාකච්ඡා කිරීමට සැලසීම සම්බන්ධව ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් තමන් කරුණු කාරණා පැහැදිලි කර දීමේ දී එම දේවල් පුද්ගලිකව නොගන්නා ලෙසත්, එම සියලු කාරණා සභාව තුල දී පමණක් ඉදිරිපත් කරන බව ද පැවසීය.

සුබ්‍රමනියම් චන්ද්‍රිකා යන අයට ජීවනෝපාය සිදු කර ගැනීමට අවස්ථාව සලසා දීමට පක්ෂපාතී වුවත් ඒ සඳහා ලබා දෙන ස්ථානය සඳහා විරුද්ධ වූ බව ද ගරු සභාපතිතුමා විසින් විනිවිදභාවයෙන් සිදු කරන ඕනෑම දෙයකට උපරිම සහයෝගය ලබා දෙන බව ද ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා පවසන ලදී.

එමෙන්ම තමන් සභාපතිව සිටි කාලයේ නගරයේ සුවපහසු වාතාවරණයක් සැලසීම අරමුණු කර ගෙන සභා අනුමැතියක් මත පදික කඩ ලබා දුන් අතර, එම කඩ ඉදිකිරීමේ සිට ලබා දීම දක්වා වන කාර්යයේ දී අවශ්‍ය සියලුම නිළධාරීන් සහභාගී කර ගත් අතර, ජංගම වෙළඳාමේ නිරතවන පුද්ගලයන්ට කඩයක් ලබා ගෙන වෙළඳාම් කිරීම පාඩු බව ඔවුන් පැවසූ නිසා හා ප්‍රතික්ෂේප කළ නිසා එම ජංගම වෙළෙන්ඳන්ට කඩ ලබා නොදුන් බව ද මෙම අයට සිදු වූයේ ද එවැන්නක් වන නමුත් එම කාලයේ දී ඉල්ලීමක් කළේ නම් ඉතුරු වී තිබූ කඩ දෙකෙන් එකක් ඔවුනට ලබා දීමට හැකිව තිබූ බව ද අභියාචනා ලබා දුන් අයගේ ලිපි අදාල ලිපිගොනුවේ පවතින නමුත් මෙම අයගේ ලිපියක් ඉදිරිපත් වී නොමැති බව ද රජයේ දේපල මංකොල්ල කන පිරිස් මෙය පිටුපස සිටින අතර, තමන් කටයුතු කළේ හෘද සාක්ෂියට අනුව බව ද යම් වරදක් වී තිබුණේ නම් එය වංචාවක් හොරකමක් නිසා සිදු වූ දෙයක් නොව එම අවස්ථාවේ දී ලබා දුන් කරුණු හා උපදෙස් මත වූවක් බව ද තමන් කිසිවෙකුගෙන් මුදල් ලබා ගැනීමක් සිදු නොකරන අතර මෙය සම්පූර්ණයෙන්ම කූට වෙළඳාමක් බව ද නිළධාරී අධීක්ෂණයකින් තොරව රාත්‍රියේ ඉදි වූ කඩයක් වීම සහ වෙනත් කරුණු කාරණා මත සාධාරණ සැකයක් ඇති වන බව ද පැවසීය.

මේ සම්බන්ධව වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා, මෙම ස්ථානය ලබා දීමේ ක්‍රියාවලිය දූෂිතව සිදු වූ ක්‍රියාවලියක් බැවින් මෙහි සියලුම කටයුතුවලට තමන් විරුද්ධ බව ද සාධාරණව සභාවට කරුණු පැහැදිලි කරමින් සිදු කරන්නේ නම් එදිනට පක්ෂව කටයුතු කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**පෙ.ව 9.33 ට පමණ ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා, මෙම පදික කඩය ලබා ගත් පුද්ගලයා නැවත ජංගම වෙළඳාමේ නිරත වුවහොත් හා අතුරු බදු දීමක් කළහොත් ගිවිසුම අවලංගු කර සභාවට පවරා ගන්නේ දැයි විමසීය.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් අතුරුබදු දීමක් කළහොත් ගිවිසුම අවලංගු කරන අතර, අනිකුත් පදික කඩ ඉදිරිපිට වහල සවිකර ගිවිසුම් කඩ කර ඇති නමුත් එහි ගිවිසුම් අවලංගු කර නොමැති බව ද මනුෂ්‍යත්වයෙන් කටයුතු කළ යුතු බව ද පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් පසුගිය කාලයේ පදික කඩ ලබා දීමේ දී හා රැකියා ලබා දීමේ දී විරුද්ධ නොවී සහයෝගය ලබා දුන් නමුත් වර්තමාන සභාපතිවරයා එක් කඩයක් ලබා දීම ගැන විරුද්ධව කතා කරන බව ද එය කුහකත්වයක් බව ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් පදික කඩ ලබා දීමේ නම් ලැයිස්තුවේ මෙම අයගේ නම ඇතුලත්ව තිබුණු නමුත් කඩයක් හිමි නොවීමට හේතුව වී ඇත්තේ ජංගම වෙළඳාම බව ද අවුරුදු 04 ක් යන තුරුම නැවත ඉල්ලීමක් නොකර පසුගිය දිනක කල

ඉල්ලීම අනුව තිබෙන හොඳම ස්ථානය ලබා දීම වැරදි බව ද පදික කඩයක් ලබා දීමට නොව එම ස්ථානයේ ලබා දීම වෙනුවෙන් විරුද්ධ වූ අතර, ඉඩ ප්‍රමාණය වැඩි නිසා රු. 3,000.00 කට එකඟ වූ බවට ගරු සභාපතිතුමා පැවසූ බව ද සඳහන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් මෙම අය ජංගම වෙළඳාමේ නිරත වන අයෙක් වන අතර, පසුගිය අවුරුදු 04 තුලම ඉල්ලීමක් කර නොමැති බව ද ත්‍රිවිල් නවතා තිබෙන වෙනත් ස්ථානයක් පිළිබඳව සාකච්ඡා කිරීමේ දී කඩ ඉදි කර ටෙන්ඩර් කිරීම සුදුසු බවට සාධාරණ අදහසක් ඉදිරිපත් වූ අතර, එයින් සතියකට පසුව මෙම තීරණය ගත් බව ද පවසන ලදී.

එමෙන්ම මෙය පිටුපස දෙදෙනෙක් සිටින අතර, ඔවුන්ගෙන් තමන් ඇතුළු විරුද්ධත්වය පළ කළ අයට කරදර ඇති විය හැකි බව ද මෙම කඩය ඉදි කිරීම සම්බන්ධව සභාවේ නිළධාරීන් හෝ සභාපතිවරයා නොදන්නේ නම් කාගේ අනුදැනුමකින් මෙය සිදුවන්නේ දැයි විමසූ ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය, මෙය අත යට ගනුදෙනුවක් බැවින් තරයේ විරුද්ධ වන බව ද ඉදිරියේ දී තවත් මෙවැනි දේ සිදු විය හැකි බැවින් හැකි ඉක්මනින් සභාව විසුරුවන්නේ නම් හොඳ බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් තමන් හෘද සාක්ෂියට අනුව කටයුතු කරන අතර, පසුගිය සංගීත සැණකෙළියේ දී විශාල මුදලක් තමන්ට ලබා දීමට උත්සාහ කළත් එය ප්‍රතික්ෂේප කළ බව ද ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් සංගීත ප්‍රසංගයක් පැවැත්වීම සඳහා යෝජනාවක් ගෙන ආ අවස්ථාවේ දී විනෝද බද්ද අයකරගනිමින් අවශ්‍ය අවසරය ලබා දුන් නමුත් එතුමියට පොල් තෙල් පහන දැල්වීමටවත් ආරාධනා කර නොතිබුණු බව ද තමන්ගේ ඉල්ලීම මත ආරාධනා කළ බව ද ටිකට්පත් මගින් සභාවට අවශ්‍ය ආදායම ලබා ගත් පසු නිදහසේ ඒ අයට වැඩ කරගෙන යාමට ඉඩ ලබා දුන්නේ තමාගේ නිවස ගිනි තැබීමේ අරගලයේ සිටි අය බව ද නොසලකා මනුස්සකමට වන නමුත් තමුන්ට ඇඟිලි දිගු කරන්නේ කුහකකමට බව ද පවසන ලදී.

එමෙන්ම හිටපු ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා මුදල් කමිටු තීරණයක් මත කඩයක් ලබා දී තිබූ අතර, එය කූට ක්‍රියාවක් හා අත යට ගනුදෙනුවක් බවට චෝදනා කිරීමට තමන්ට හැකි නමුත් එසේ නොකළ බව ද සිත් තුල පවතින කුහකකම් කතාවලින් හෙළි වන බව ද සභාව විසින් තීරණය කළ කඩයක් ලබා දුන් අතර, අංක 01 ට නම තිබෙන අයෙකුට කඩය ලබා දීම සාධාරණ බව ද පදික කඩ 32 ලබා දුන් ක්‍රමවේදයටම මෙය ලබා දුන් බව ද මුදල් කමිටුවේ තීරණය මත ලබා දුන් කඩයට හා අනික් කඩවලට පරීක්ෂණයක් කරන ලෙස ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීමක් කර ඇති බව ද කඩ පේළියේ කඩ ලබා දී ඇත්තේ ලැයිස්තුවේ පිළිවෙලට නොව දේශපාලන හිතවත්කම් සලකා බව ද පැවසීය.

ගරු සභාපතිතුමා තවදුරටත් අදහස් දක්වමින් හරක් මස් කඩය ටෙන්ඩර් කිරීම රු.750,000.00 කරන ලෙස සභාවෙන් තීන්දුවක් ලබා දුන් අතර, එහි ක්‍රමවේදය වැරදි බව ලේකම්තුමා ඇතුළු නිළධාරීන් පෙන්වා දුන් නමුත් ඒ සඳහා ඇහුම්කන් නොදී මෙම මුදල තීරණය කළ බව ද සභාවට ආදායම වැඩි කර ගැනීම පිළිබඳ ගරු මන්ත්‍රීවරුන් උනන්දු වන නිසා ප්‍රසම්පාදනයට නොගිහින් සිටීම වැරදි බැවින් මීළඟ සභාවේ දී මාළු කඩ ටෙන්ඩර් කිරීමට කටයුතු කරන බව ද පවසන ලදී.

අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පුදකරමින් පෙ.ව 10.03 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

ඩබ්.ඒ වසන්ත ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.